




වේලාව කීයද?

''කිර්ලිංං, කිර්ලිංං' කිර්ලිංං, කිර්ලිංං''

ඒ පන්හිඳගේ ජංගම දුරකථනය පන් කරුවලේම අත පත ගාලා දුරකථනය අතට ගත්තා.
''වෙලාව කීය ද? '' පැන්සල එහා ඇඳේ ඉදන් ඇහුවා.

''කවුද බොලේ මේ මහ රෑ ජාමේ?'' පින්සලටත් ඇහැරිලා ''ලංකාවෙන් වෙන්නැ'ති .....'' පැන්ට නින්ද කැඩුන එකට තරහයි වගේ.

''වෙලාව පාන්දර දෙකයි...'' පින් මිමිණුමේ පන්නේ දුරකථන කතාවට හරස් නොවන විදියට හීන් හඬින් අනික් අයගේ නින්දට බාධාවක් නොවෙන්නේ පන් ජංගමයක් අරගෙන ආලින්දය පැත්තට ගියා. ඒ වුණාට පන්ටයි පින්ටයි නින්ද ගියේ නෑ.

''හදිස්සියක්වත් ද? කරදරයක් වත් ද?

පැන්ගේ මව් අසනීපයෙන් ඉන්න කාලේ මේ වාගේ දුරකථන පණිවිඩ ලැබුණාම පැන්නේ ඇග හිරි වැටෙනවා. ඒ පුරුද්දට තවමත් මේ කට්ටිය අවේලාවේ එන දුරකථන පණිවිඩයවලට බයයි. පන් කතාව ඉවර කරලා එනකල් පැන් පින් දෙන්නම උන්නෙ නො ඉවසිල්ලෙන්.

'මොකද?'

''කවු ද?'' පැන්, පින් දෙන්නා කාමරේ දිහාට එන පන්ගෙන් ඇහුවෙ එකටමයි.

''අර අපේ පන්තියේ උන්නු සමරසිංහ මතක ද සමරෙයව?'' පන් තමුන්ගේ අනික් පන්ති මිත්‍රයො දෙන්නගෙන් ඇහුවා.

''ඉතින් ?''

''නිකං.... නිකමට අපිව මතක් වුණා ලු කතා කරන්න සිතුනළු.''

දෙකක් දා ගෙන වෙන්නැති..''

''කිව්වෙ නැද්ද වෙලාව කීය ද කියලා''

''සොරි මචං'' කිව්වේ... '' පන් ආයෙමත් පොරොනය යටට රිංගුවා.

''අපේ අයට වෙලාව ගැන කිව්වක් නැති හැටි...'' පැන් කිව්වෙ නොක්කඩුවට වාගේ.

''එහෙ ඉන්න අය ගැන නම් තව හතාගන්න පුළුවන්. මෙහේ ඉන්න අපේ අය පවා අපේ දේවල්වලදි වැඩ කරන්නේ වෙලාව ගැන ගණන් ගන්නේ නැතිවනෙ.''

''ඒවට ඉතින් හේතුන් තියෙනවා. හිතල බලන්න ඒන ඒ හේතු සාධාරණද කියලා මඟ කොට කරදර, රථවාහන තකබදය අනතුරු මාගේ දේවලේ නිසා වෙන පමාවල් වලට නම් සමාව දෙන්න ඕන. ඒත් සමහර අය පුරද්දකට වගේ එන්න පමාවෙලා. ලංකාවෙ මැති ඇමතිවරුවගේ ඒ රැස් වෙලා ඉන්න අයගෙ අවධානය ගන්නත් එක්ක.''

''එහෙදි නම් ජන නායකයෝ එනකොට හිට ගන්නත් එපා යෑ.''

''මතක ද අපි ඉස්කෝලෙ කැඩෙට්න් කරන කාලෙ? තමන් එක්ක ශිෂ්‍යභට පුහුණුව එකතු වෙලා උන්නු විල්ගෙන් පන් ඇහුවා.

''ඩිලේ නම් ඩබල් අපේ'' තමයි ඉතින්...'' පින් ඒ කාලේ පුරුදු වෙලා තිබුණ වචන වලින් කිව්වා. අනික් අය කරන අභ්‍යාස දෙගුණයක් වේගයෙන් කරන එකයි. ''ඩබල් අප්'' කියන්නේ. පමාවට දඬුවම ඒ විතර්කම නෙවෙයි. වැඩිපුර අභ්‍යාස කරවන එකත් එක් වෙනවා.

''අනේ ඔර්ලෝසුවක් බඳින්න වත් වත්කමක් නැති ඒ කාලේ බස්වල, කෝච්චිවල ගිහිල්ලත් වෙලාවට තැනකට යන්න පුරුදු වුණේ ඒ හින්දනේ...''

''ඒත් මේ වන කොට මෙහිදි මොනවද අපට වෙලා තියෙන්නේ?''

''මේ රටේ විදියට කෙරෙන වැඩ කටයුතුවලට අපි කොහොමහරි හරි වේලාව යනවා. අඩු තරමේ යන්න උත්සාහ කරනවා. අපේ අයගේ අපේ වැඩවලදි තමයි වෙලාව ඒතරම්ව වැදගත් විදියට නොහිතන්නේ.''

''හැබැයි ඉතින් මෙහේ අයත් රනින් ලේට් කිය කියා දුවන වෙලාවල් නැත්තේ නෑ.''

''සති අන්තයේ නම් ඉතිත් වෙන වැඩ කටයුතුත් එමටයි. ඒ ගෙදර දොරේ වැඩවලට අමතරව මේ 'ඩේ ලයිට් සේවිං'' එක නිසාත් වෙලාව ගතවෙනව තේරෙන්නේ නෑ. මේ දවස්වල හවස හයටත් හොඳට ඉර එළිය. දන්නෙම නැතිව පමා වෙනවා. සමහර දේවල් පටන්ගන්න සුදුසු කරුවල වැටුණාම. ඒත් මේ කාලේ කරුවල වැටෙනකොට පමාවෙලා ඉවරයි.''

''මොනවා වුණාත් හැමෝගෙම වෙලාවට වටිනාකමක් තියෙනවා. අපේ රස්සාවලදි, ව්‍යාපාරික කටයුතුවලදී තමන්ගෙ කාලය වෙනුවෙන් පැයකට නියම කරගත් මූල්‍යමය වටිනාකමක් තියෙනවා. ඒ කියන්නේ එක් එක්කෙනාගේ පැයක් ඩොලර් කීයක් වටිනවද කියන එක ඒක ඒ ඒ අයගෙ පළපුරුද්ද, හැකියාව වාගේ දේවල්වල හැටියටිය තීරණය වෙන්නේ. පෞද්ගලික ව්‍යාපාරවලි නම් ඒ ඒ අයට තියෙන ඉල්ලුමක් බලපානවා.

''පැන් ඔහොම කියනාකොට මතක් වෙන්නෙ අපි කාලෙකට ඉස්සර ලංකාවට ගිය වෙලාවට බලපු වේදිකා නාට්‍යයක්. මතකද සහන් රන්වල මහත්යාගේ ''වෙලාව කීය ද?'' වේදිකා නාට්‍යය?'' පින් ගිය තරමක අතීතයකට.

'ඔව් අර සම්මාන පහත් ද හයක් ද දිනුවූ නාට්‍යයක් දැන් බලන්නපින් ඒ නාට්‍යයේ කතා කලේ කාලයක් එක්ක අරගලයක පැටලිලා ඉන්න කෙනෙක් ගැන. මොනතරම් මේ ලෝකය කාර්ය බහුල වෙලා ද කියනවනම් තමන්ගේ අම්මා ගැන බලන්නවත් උන්නැහේට වෙලාවක් නැතිවෙලා''

''මොකද ඒ ?''

"තරඟය, තරගය... '' පින් හිනාවුනා හයියෙන්ම.

''අපි වැටිලා ඉන්නේ පුදුම තරඟයකට. දවසේ පැය විසි හතර මදි ඇත්තටම. වෙලාව කීයද කියලා බලන්නවත් වෙලාවක් නැති තරම්. පැන්සලක් එකතු වුණා ඒ හිනාවට.

''මං හිතන්නේ අපිට තියෙන වටිනාම දේ තමයි කාලය.

මොකද ඒක අපේ ජීවිතයට වයසට බැඳිලමයි තියෙන්නේ. මේ ගෙවෙන මොහොත ජීවිතයේ ආයෙත් ලැබෙන්නේ නෑ. මේ වෙලාවේ අපට මග හැරෙන දේ අපට ආයෙ ලබා ගන්න බෑ. මේ වේලාවේ මේ හයි හත්තියෙන් තරන දේ ඒ හැටියටම ඊළඟ මොහොතේ කරන්න බෑ. මොක දඒ වෙනකොටත් අපේ ආයුෂ ටිකක් හරි ගෙවිලා ශරීර ශක්තිය හීන වෙලා. මේ දේ අඛණ්ඩවට වෙන දෙයක් පැන් තමන්ට හිතෙන දේ කියාගෙන ගියා.

'එකනේ' අප්පමාදෝ අමතපදං
පමාදෝ පච්චුනෝ පදං
අප්පමත්තා න මියන්ති
යේ පමත්තා යතා මතා.'
කියලා බුදු බණේත කියලා තියෙන්නේ. පින්සලට තමුන්ගේ ඉස්කෝලේ ලාංජනයේ තියෙන ධර්ම පාඨය මතක් වෙලා. ධම්ම පදයේ අප්පමාද වග්ගයේ එන කවුරුත් දන්නා ගාථාවදක් ඔය. අපමාව සිහිනුවණින් හොද දේවල්වල යෙදිම නිවන ලැබීමට හේතු වෙන බවයි. ගාථාවෙන් කියවෙන්නේ පමාව මරණයට හේතු වුණෝ අප්‍රමාදයෙන් යුතු අය මරණයට පත් නොවන නිවනට ලගා වෙන එක ධර්මයේ කියවෙන්නේ ඒ විදියට.

''ග්‍රීස් - පුෂ් - ටික්
ග්‍රීස්- පුෂ් - ටිකක්''

ලංකාවෙන් ආව දුරකතන පණිවිඩේට උත්තර දුන්න පන්හිඳ නින්දට වැටිලා ගොරවන්නත් පටන් රන් අමුතුම විදියකට පැන්සලයි. පින්සලයි නින්ද කඩාගෙන කයියට වැටුන හන්දා නින්ද කියන එක දෙන්නගෙ අහලකවත් නැති යා හැකිය.

''අරුන්ද ගොරවන්නත් පටන් අරන්. අපට ඉතින් එළිවෙනකල් ඇහැරගෙන ඉන්නයි වෙන්න. වෙලාව කීයද? ''පැන් ඇහුවා''

''තවත් එළිවෙන්න දෙයක් නෑ. හතරයි දැනටමත් වෙලාව'' ඒ පින් පමා නොවී නින්දක් ගහන්න ට්‍රයි කරමු.'' පැන් පොරොනයේ ගුලි වුණා.

''ඔව් නැත්නං හෙට දවල්ටත් නිදිමරන්නයි වෙන්නේ'' පින්සලත් ඇදේ අනිත් පැත්තට හැරුණා.

TILING

All kinds of TILING works
Including-
*Paving / stepping stones,
*Waterproofing (Indoor and Outdoor),
*Landscaping,
*Retaining Walls,
*Caulking (Silicon finish)

No job too small or big

Contact
THIMIRA (TIM) 0401975648